## ශ්‍රී ලංකාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන නීතිය

ශ්‍රී ලංකාවේ වත්කම් හා බැරකම් හා සබැඳි ප්‍රධානතම නෛතික ප්‍රතිපාදනය ලෙස 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් කිරීමේ පනත පෙන්වා දී අතර එහි වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු පුද්ගලයන් ඉදිරිපත් කළ යුතු අතර හා වත්කම් හා බැරකම් හා බැඳී පවතින අනුශාංගික දඬුවම් පිළිබඳව නෛතික විධිවිධාන සපයා ඇත¡ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් පනත දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ ධූරකාලයේ දී 1988 අංක 74 දරන පනතින් සංශෝධනයට ලක්කොට එය මෙරට බලාත්මක නීතියක් බවට පත්කරන ලදි¡

මැතිවරණ සම්බන්ධයෙන් වත්කම් හා බැරකම් පනත අතර පවත්නා සබැඳියාව හා එහි වැදගත්කම වනුයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළුව ජනාධිපතිවරණ" පාර්ලිමේන්තු මැතිවරණ" පළාත්සභා මැතිවරණ" පළාත් පාලන මැතිවරණ යන මැතිවරණ සඳහා නාම යෝජනා භාරදෙනු ලබන අපේක්ෂකයින් විසින් ද අපේක්ෂකත්වය ලැබූ දිනෙන් මාස 03 ක් ඇතුළත මෙම ප්‍රකාශ භාරදිය යුතු වීමයි¡

මෙම පනත යටතට ගැනෙන වැරදි සම්බන්ධයෙන් 1994 ට පෙර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා 1958 අංක 40 දරන පනතින් ස්ථාපනය කරන ලද අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුවට බලය ලබා දී තිබුණු නමුත් 1994 අංක 19 පනතින් සංස්ථාපනය කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂම වෙත බලය පවරා දී ඇත¡

එමෙන්ම වත්කම් හා බැරකම් පරීක්‍ෂා කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමේදී 1991/02/19 වන දින නිකුත් කරන ලද අංක 650/7 ගැසට් නිවේදනය අනුව රු¡ 750 ක චෙක්පතක් ගෙවීමෙන් අනතුරුව අදාළ මන්ත්‍රීවරයාගේ වත්කම් හා බැරකම් කථානායකවරයා වෙත ලිපියක් යොමුකිරීමෙන් අනතුරුව ලබාගත හැකිය¡ [1]

## මැතිවරණ නිරීක්‍ෂණ ක්‍රියාවලිය හා මැතිවරණ ප්‍රචාරණ වියදම් නිරීක්‍ෂණය

### හැඳින්වීම

මැතිවරණයක දී මුදල් යනු කිසිදිනක නොවැදගත් වන්නක් නොවේ¡ මේ නිසා මැතිරිණ නිරීක්‍ෂණ මෙහෙයුම්වලදී සැළසුම් අදියරේදීම ප්‍රචාරණ වියදම් පිළිබඳව අවදානය යොමු කර එය නිරීක්‍ෂණය ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය¡ නමුත් මෙහිදී සැළකිය යුතු කරුණු වනුයේ මැතිවරණයන්හි දී මුදල් හා සාධකය කිසිදිනක නොවැදගත් නොවූවද එය එක් එක් රටවල යොදාගනු ලබන ආකාර පිළිබඳව මෙන්ම එක් රටක් තුළ පවා මැතිවරණ අනුව වෙනස් ස්වභාවයක් ගනු ඇති බවයි¡ උදාහරණ ලෙස ඇතැම් විට මුදල් යන සාධාකය වලංගු වන්නේ අපේක්‍ෂකයා තෝරා ගැනීමේ දී පමණක් විය හැකි වන අතර තවත් රාජ්‍යයක එය ඊට වෙනස් මුහුණුවරක් ගනු ඇත¡

මැතිවරණයක දී තාක්ෂණික කරුණු කාරණා පිළිබඳව වඩාත් හොඳින් කටයුතු කළ ද රාජ්‍ය දේපළ අවභාවිත කිරීම් පිළිබඳව පෙ රමැතිවරණයන්හි වාර්තා තිබේනම් මැතිවරණ නිරීක්‍ෂණ ක්‍රියාවලිය තුළ ප්‍රචාරණ වියදම් නිරීක්‍ෂණය කිරීම සිදුකිරීම වඩාත් ඵලදායී පියවරක් වනු ඇත¡ නමුත් මෙහිදී පෙන්වාදිය යුතු වන්නේ ප්‍රචාරණ වියදම් සඳහා මුදල් භාවිතය යන කරුණ බොහෝ රටවල මේ වනතුරුත් අධ්‍යයනය කරමින් පවතින විෂය ක්ෂේත්‍රයක් වීමයි¡

[1] 1985 අංක 29 හා 1988 අංක 74 දරන පනත් වලින් සශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත

## මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් දීර්ඝ  කාලීන නිරීක්ෂණ

## මැතිවරණ ප්‍රචාරක වියදම් අතර හා නිරීක්ෂණය සඳහා මඟ පෙන්වීම

| වියදම් වර්ග | නිරීක්ෂණ ක්‍රමවේදය | නිරීක්ෂණය කිරීම සඳහා ඇති හැකියාව |
|---|---|---|
| මාධ්‍ය ප්‍රචාරණ | මාධ්‍ය නිරීක්ෂණය/අධීක්ෂණය | පොදුවේ මාධ්‍ය පිළිබඳ අධීක්ෂණයක් සිදුකළ හැකිය ; |
| පෝස්ටර්" බැනර්" කටවුට්ස් | තෝරාගත් ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර අධ්‍යයනය | දීර්ඝ කාලීන නිරීක්ෂණයන් හට බිල්බෝර්ඩ් ආදිය ගණනය කිරීමට හැකියාව ඇත සහ ඒවාට යෙදවෙන මුදල් ප්‍රමාණය ගණනය කළ හැකිය ; |
| ප්‍රචාරණ රැළි | සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය | ඵලදායී ලෙස නිරීක්ෂණය කළ හැකිය ; |
| ගෙන් ගෙට යාමේ ප්‍රචාරණය | සම්මුඛ සාකච්ඡා" සහභාගීත්ව නිරීක්ෂණ | ඵලදායී ලෙස නිරීක්ෂණය කළ හැකිය ; |
| රජයේ දේපළ අයථා පරිහරණය (රාජ්‍ය මාධ්‍ය" වාහන හා මුදල්) | මාධ්‍ය වාර්තා" සම්මුඛ සාකච්ඡා" සහභාගීත්ව නිරීක්ෂණ | තොරතුරු ලබාගැනීමට පහසුවන නමුත් ඒවා තහවුරු කිරීම අසීරුව |

## දීර්ඝකාලීන හා කෙටිකාලීන නිරීක්ෂකයින්

## මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය අතරතුර ක්‍රියාවේ යොදවන අයුරු

| කාර්ය | අදහස් | කාල රාමුව |
|---|---|---|
| ආකෘතිය විශ්ලේෂණය කිරීම | දේශපාලන මූල්‍ය ගැටළු පිළිබඳව දැනුමක් සහිත පුද්ගලයෙකු විසින් විශ්ලේෂණය කළ යුතුය ; මැතිවරණ නිරීක්ෂණ සඳහා දේශපාලන මූල්‍ය ගැටළු පිළිබඳ අන්තර්ගත වීම පිළිබඳ වූ නිර්දේශ මෙම විශ්ලේෂණයේදී ඇතුළත් විය යුතුය ; | නිරීක්ෂණ ක්‍රියාවලිය ආරම්භයේදී සිදු කළ යුතුය ; |
| දේශපාලන මූල්‍ය පිළිබඳ පුහුණුවීම් ලබා ගැනීම ; | දේශපාලනයේ දී සිදුකෙරෙන ප්‍රචාරණ වියදම් පිළිබඳව නිරීක්ෂණ ක්‍රියාවලියට අන්තර්ගත කරන්නේ නම් රටේ මූල්‍ය පාලන තන්ත්‍රය පිළිබඳ වියදම් හා සබැඳි මූලික මූලධර්මය පිළිබඳව හා එහි නීති රීති පිළිබඳව නිරීක්ෂණ | මූලික රාමුව පිළිබඳ අධ්‍යයනයෙන් අනතුරුව |

| | | |
|---|---|---|
| | කණ්ඩායමේ සාමාජිකයන් දැනුම්වත් කළ යුතුය ¡ | |
| මැතිවරණයට පෙර ලබාදෙන ලද මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය | මැතිවරණ ප්‍රචාරණයට පෙර ඇතැම් අවස්ථාවලදී දේශපාලන අපේක්ෂකයන් හා දේශපාලන පක්ෂ මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුවන අතර" එම වාර්තා පොදුවේ ලබාගත හැකිනම් හා මෙම මැතිවරණ ප්‍රචාරණ වියදම් යන කාරණය හා සම්බන්ධ නම් එම වාර්තා ඉතා වැදගත් තොරතුරු ලබාදෙනු ඇත ¡ | ප්‍රචාරණ වියදම් කටයුතු අතරතුර හා ආරම්භ කිරීමට පෙර |
| මැතිවරණ ප්‍රචාරණ වියදම් සම්බන්ධ කටයුතු කරන අනෙකුත් දේශීය කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය | මැතිවරණ ප්‍රචාරණ වියදම් සම්බන්ධ තොරතුරු හුවමාරු කරගැනීම තුළින් තොරතුරු සහතික කර ගැනීම ¡ | මැතිවරණ ප්‍රචාරණ වියදම් කටයුතු සිදුකිරීම ආරම්භයේදීම ¡ |
| මැතිවරණ ප්‍රචාරණ වියදම් සම්බන්ධව නීති සම්පාදනය කරන පුද්ගලයන් සමඟ සාකච්ඡා පැවැත්වීම ¡ | පවත්නා නීති බලාත්මක කිරීම සම්බන්ධව ඔවුන් සතුව පවත්නා හැකියාව හා කැමැත්ත පිළිබඳ නිශ්චය කිරීම | මැතිවරණ ප්‍රචාරණ වියදම් සිදුකෙරෙන කාලසමය තුළ හා හැකියාවක් පවතී නම් මැතිවරණ කාල සීමාවෙන් පසුවද |
| දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා පැවැත්වීම | ඔවුන් සතුව මැතිවරණ ප්‍රචිරණ වියදම් සම්බන්ධ බලාත්මක නීති කෙරේ¡ පවත්නා දැනුම නියාමනය හා ඔවුන්ගේ හැකියාවන් හා එම නීති කෙරේ ඇති කැමැත්ත පිළිබඳ නියාමනය කිරීම | |
| මාධ්‍ය හා සිවිල් සමාජය සමඟ සාකච්ඡා පැවැත්වීම | දැනට බලාත්මක නීති පිළිබඳව ඔවුන් සතුව පවත්නා දැනුම්වත්භවය පිළිබඳව ඇගයීම හා ඔවුන්ගේ අපක්ෂපාතී බලාත්මක කිරීම් පිළිබඳ ඇගයීම ¡ | මැතිවරණ ප්‍රචාරණ වියදම් සිදුකරන කාල සිමාව තුළ හා හැකියාවක් පවතී නම් මැතිවරයෙන් පසුද |
| රාජ්‍ය මාධ්‍ය අවභාවිතය පිළිබඳව නිරීක්ෂණය | රාජ්‍ය මාධ්‍ය විසින් තම අනුග්‍රහය දක්වනු ලබන්නේ තෝරාගනු ලැබූ දේශපාලන පක්‍ෂ කිහිපයකට පමණක්ද යන්න පිළිබඳව හෝ අනෙකුත් පක්ෂ නොසළකාහරිනු ලැබ ඇත්දැයි විශ්ලේෂණය කළ යුතුය ¡ | ප්‍රචාරණ කාල සීමාව පුරා |
| මාධ්‍ය ප්‍රචාරණ වියදම් නිරීක්‍ෂණය | දැන්වීම්වල විශාලත්වය හා දැන්වීම් සංඛ්‍යාව ගණනය කිරීම ඔස්සේ ප්‍රචාරණය සඳහා වැයවන මුදල ගණනය කිරීම ¡ | ප්‍රචාරණ කාල සීමාව පුරා |

| | | |
|---|---|---|
| දිගු කාලීන නිරීක්ෂකයින් හා කෙටි නිරීක්ෂකයින් ප්‍රචාරණ වියදම් හා බැඳී ගැටළු පිළිබඳ පුහුණු කිරීම ; | පොදුවේ මැතිවරණ ප්‍රචාරණ වියදම් හා බැඳුනු නීති මෙන්ම කරුණු හා විශේෂ වැදගත්කමකින් යුතු කරුණු පිළිබඳ පුහුණු කිරීම ; | දිගුකාලීන හා කෙටිකාලීන නිරීක්ෂණයන් සඳහා පුහුණු කිරීම් සිදුකිරීම් සිදුකරන අතරතුර |
| පවත්නා දත්ත පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණය | මෙහිදී වාර්තා ඉදිරිපත් කරන ලද ස්ථානය හා ඒවා මහජනතාව වෙත ලබාගත හැකිවිය යුතු අතර PFR සඳහා ජාතික වශයෙන් පුද්ගලයෙකු සිටිය යුතු අතර ඔහු තොරතුරු සඳහා ප්‍රවේශ වීමට විය යුතුය ; | දේශපාලන පක්ෂ/ අපේක්ෂකයින් විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ; |

## දීර්ඝ කාලීන නිරීක්ෂකයන් සතු කාර්යයන්

| කාර්ය | අදහස | කාලරාමුව |
|---|---|---|
| නීත්‍යානුකූල නොවන වියදම් පිළිබඳව නිරීක්ෂණ | නීතිවිරෝධී වියදම් සිදුවන්නේ ද නැද්ද යන්න පිළිබඳව ප්‍රචාරණ රැළි හා ප්‍රචාරණ වියදම් පිළිබඳව නිරීක්ෂණය කිරීමෙන් සොයා ගත හැකිය ; (උදාහරණ ලෙස මුදල් බෙදාහැරීම් සහ රාජ්‍ය දේපළ අවභාවිත කරයිද යන්න) | මැතිවරණ ප්‍රචාරණ කාල සීමාවේ ; |
| අපේක්ෂකයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම | මැතිවරණ ප්‍රචාරණ වියදම් වලට අදාළව බලාත්මක නීති පිළිබඳ අපේක්ෂකයන් සතුව පවත්නා දැනුම සම්බන්ධව හා ඔවුන් සතුව එම නීති කෙරේ පවත්නා නැමියාවන් හා පිළිබඳ ඇගයීම | මැතිවරණ ප්‍රචාරණ කාල සීමාවේ ; |
| බිල්බෝඩ් ආදියට යනාදිය පිළිබඳ ගණනය කිරීම | තෝරාගත් ප්‍රදේශයෙහි පක්ෂ/සහ/හෝ අපේක්ෂකයන් සඳහා වූ බිල්බෝර්ඩ්" බැනර් යනාදිය පිළිබඳව දේශීය සැපයුම්කරුවන්ගේ මිල ගණන් ඇසුරින් ගණනය කිරීම | මැතිවරණ ප්‍රචාරණ කාල සීමාව |
| මාධ්‍ය භාවිතය හා බැඳුනු මිල ගණන් ගණනය කිරීම | දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් විසින් ගුවන් විදුලි නාලිකාවන්හි ආදියෙහි සිදුකරනු ලබන ප්‍රචාරණ දැන්වීම් නිරීක්ෂණය කිරීම ; | මැතිවරණ ප්‍රචාරණ කාල සීමාව |
| කෙටිකාලීන නිරීක්ෂකයක් සඳහා ප්‍රචාරණ වියදම් ගැටළු පිළිබඳව අමතර දැනුම ලබාදීම | නීත්‍යානුකූල නොවන වියදම් හා අවසර ලබාදී තිබෙන ප්‍රචාරණ වියදම් සම්බන්ධව කෙටිකාලීන නිරීක්ෂකයින් දැනුම්වත් කිරීම ; | මැතිවරණ ප්‍රචාරණ කාල සීමාව ; |

## කෙටිකාලීන නිරීක්ෂකයන් හා බැඳුනු නිරීක්ෂණ

| කාර්යය | අදහස් | කාලරාමුව |
|---|---|---|
| මැතිවරණ දිනයේ ඡන්ද මිලදී ගැනීම් පිළිබඳ නිරීක්ෂණය | දේශපාලන පක්ෂ නියෝජිතයන් සහ/හෝ අපේක්ෂකයන් ඡන්දදායකයන් සඳහා භාණ්ඩ බෙදාහැරීම ආදිය සිදුකරන්නේ ද යන්න පිළිබඳව නිරීක්ෂණය කිරීම | මැතිවරණ දිනය (දිනයට පෙර හා පසු) |
| ප්‍රචාරණ කාල වකවානුවේ අවසානය කාල සීමාවේ දී රාජ්‍ය දේපළ අවභාවිත කිරීම පිළිබඳව නිරීක්ෂණය | මෙහිදී මැතිවරණය දින කිහිපයකට පෙර රාජ්‍ය දේපළ අවභාවිත කරන්නේ ද නැද්ද යන්න පිළිබඳව නිරීක්ෂණය කළ යුතුය ; (උදාහරණ ලෙස රජයේ වාහන මෙම අවභාවිතාවන් ප්‍රචාරණ කාල සීමාවේ අවසාන අදියරේ දී සිදුවිය හැක ; ) | |
| දේශපාලන පක්ෂ විසින් ප්‍රවාහන පහසුකම් ලබාදීම සිදුකරන්නේ දැයි නිරීක්ෂණය කිරීම | ඡන්දදායකයන් හට ප්‍රවාහන පහසුකම් ලබාදෙනවා නම් ඒවා නිරීක්ෂණය | මැතිවරණ දිනය |
| රාජ්‍ය දේපළ තමන්ගේ අපේක්ෂකයන් විසින් හෝ දේශපාලන පක්ෂයන් විසින් අවභාවිත කරන්නේදැයි නිරීක්ෂණය කිරීම | රජයට අයත් වාහන අපේක්ෂකයින් විසින් හෝ පක්ෂ භාවිතා කරන්නේදැයි නිරීක්ෂණය කිරීම ; | මැතිවරණ දිනය |